චක්‍රලේඛ අංක : 07 /2023 (1)

WPCEC/MA 01/ චක්‍රලේඛ
සමූපකාර සේවක කොමිෂන් සභාව (බ.ප.),
අංක 628 ,
ජනජය සිටි ගොඩනැගිල්ල,
8 වන මහල , නාවල පාර ,
රාජගිරිය.
2023.12. 12

බස්නාහිර පළාතේ,
සියළුම වි.සේ.ස. සමිති, දිස්ත්‍රික් ග්‍රාමීය බැංකු සංගම්, සමූපකාර ණය දෙන සමිති,
දිස්ත්‍රික් සමූපකාර මණ්ඩල හා අනෙකුත් සියළුම ලියාපදිංචි සමූපකාර සමිති
සභාපතිවරුන් වෙත.

<u>බස්නාහිර පළාත් සමූපකාර සේවයේ විධායක නොවන තනතුරු සඳහා බඳවා ගැනීම සම්බන්ධව</u>

සමූපකාර ක්ෂේත්‍රයේ විධායක මට්ටමේ තනතුරු සඳහා බඳවා ගැනීමේදී ඊට අදාල සම්මුඛ පරීක්ෂණ වලදී අයදුම්කරුවන් විසින් සාවද්‍ය සහතික ඉදිරිපත් කර සුදුසුකම් තහවුරු කරන බවට කොමිෂන් සභාවට අනාවරණය වීම මත 07 /2023 චක්‍රලේඛය නිකුත් කරනු ලැබූ අතර, එම තත්වය අනෙකුත් තනතුරු සම්බන්ධයෙන්ද එසේම වන බැවින් ඉහත චක්‍රලේඛයට සමගාමීව හා වැඩිමනත් වශයෙන් සමූපකාර ක්ෂේත්‍රයේ විධායක ගණයට අයත් නොවන අනිකුත් සියළු තනතුරු සම්බන්ධයෙන් මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

02. ඒ අනුව විධායක ගණයට අදාල නොවන සියළුම තනතුරු වල පත්වීම් අනුමත කිරීම සඳහා නියමිත කාලය තුල කොමිෂන් සභාව වෙත යොමු වන ලිපි සඳහා අවශ්‍ය පත්කිරීම් අනුමැතිය දෙනු ලැබේ.එහෙත් සේවකයකුට නිකුත් කරනු ලබන පත්වීම් ලිපිය ප්‍රකාරව සේවකයන් පරිවාස කාලය අවසන් වීමට ප්‍රථම සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කල සහතික පත්‍ර වල නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමට සමිතිය විසින් කටයුතු කල යුතුය. යම් අයදුම්කරුවෙකු ඉදිරිපත් කර ඇති එක් සහතිකයක් හෝ ව්‍යාජ බවට තහවුරු වුවහොත් එම අයදුම්කරුවන්ගේ සේවය අවසන් කිරීමට කටයුතු කල යුතු වේ.

03. ඉහත පරිදි පත්වීම් අනුමැතියට යොමු කල අයදුම්කරුවකු සම්බන්ධයෙන් පත්කිරීම් අනුමැතිය දීමට ප්‍රථම හෝ ඉන් පසුව සමූපකාර සේවක කොමිෂන් සභාව වෙත විරෝධයක් යොමු වුවහොත් ඒ සම්බන්ධයෙන් කොමිෂන් සභාව මැදිහත් වී අවශ්‍ය කටයුතු කරනු ලැබේ.

කොමිෂන් සභා නියමය පරිදි

එස්.ජේ.ජයසිංහ.
ලේකම්
සමූපකාර සේවක කොමිෂන් සභාව
බස්නාහිර පළාත

පිටපත් :
1. ලේකම් පළාත් මාර්ග ප්‍රවාහන සමූපකාර සංවර්ධන අමාත්‍යාංශය (බ.ප. )- කා.දැ.ගැ.පි.
2. සමූපකාර සංවර්ධන කොමසාරිස් හා සමිති රෙජිස්ත්‍රාර් (බ.ප.) - කා.දැ.ගැ.පි.